**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 2013**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන් වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත්, දැනට භාවිතයට ගන්නා පිරිවැය රු.1,314,600,400 ක් වූ වත්කම්, ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2001 වර්ෂයේදී රු.මිලියන 61.5 ක් වියදම් කර මිලදීගත් කොහුවල ඉඩම හා ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයකට නොගැලපෙන හෙයින්, කැළණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය වෙත 2003 ඔක්තෝම්බර් 17 සින පවරා දී තිබූ නමුත්, මෙම පැවරීම සම්බන්ධව ගැළපීම් ගිණුම්ගතනර නොතිබුණි.

**2.2.2 නොසැසඳුණු පාලන ගිණුම්**

පර්යේෂණ අත්තිකාරම් ගිණුම් ශේෂය (වෛද්‍ය පීඨය) හා ගිණුම් සඳහා ඉදිරිපත් කළ උපලේඛණ අතර රු.77,753 කින් වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුනරුත්ථාපන විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ අත්තිකාරම් තුළ රු.90,249 ක ශේෂයක් පෙන්නුම් කළද එම අත්තිකාරම් ලබාදුන් පුද්ගලයින් හෝ ආයතන සම්බන්ධ විස්තර විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණු අතර, එම ශේෂය හඳුනානොගත් ශේෂයක් බව අනාවරණය විය.

(ආ) මූල්‍ය තත්ත්ව විස්තරයේ අත්තිකාරම් තුළ ඇතුළත් මහරගම නගර සභාවට ගෙවන ලද රු.1,310,000 ක් වූ මූලධන අත්තිකාරම් තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් ලිපිගොනු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(අ) මූල්‍ය තත්ත්ව විස්තරයේ විවිධ අත්තිකාරම් ලෙස දක්වා ඇති රු.94,690,359 වූ ශේෂය තුළ ඇතුළත් වර්ෂ 5 ඉක්මවූ රු.3,818,485 ක ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මහපොළ ශිෂ්‍යත්ව ලබාදීම සඳහා මහපොළ භාරකාර අරමුදලින් ලැබෙන මුදල්වලින් හිමිකම් නොපෑ ශිෂ්‍යත්ව අරමුදල් වහාම මහපොළ භාරකාර අරමුදල වෙත ගෙවිය යුතු වුවත්, වර්ෂ දෙකේ සිට වර්ෂ පහ දක්වා කාල පරාසයකට අයත් රු.11,753,550 ක ශිෂ්‍යත්ව මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) විවිධ තැන්පතු ගිණුම්වල වර්ෂ 5 ඉක්ම වූ රු.4,060,069 ක් හා වර්ෂ දෙකේ සිට වර්ෂ පහ දක්වා කාලයට අදාළ රු.2,295,569 ක් පැවති අතර, එම මුදල් හඳුනාගෙන නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂ කිහිපයක සිට පැවත එන පාඨමාලා හා ව්‍යාපෘතිවලින් ලැබිය යුතු රු.291,642 ක මුදලක් මේ වන තෙක් ලැබී නොමැති අතර, ඒ සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| <u>නීති රීති රෙගුලාසි යනාදියට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|
| (අ) <u>විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය</u> | |
| (i) v වන පරිච්ඡේදයේ 7.6.1 වගන්තිය | ගිවිසුම් කඩකල ආචාර්යවරුන් විසින් ගෙවිය යුතු බැඳුම්කර වටිනාකම නියම කරන ලද කාලය තුළ ගෙවීමට අපොහොසත් වන්නේ නම් සති තුනක් ඇතුළත ඇපකරුවන් වෙත දන්වා යැවිය යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. |
| (ii) v වන පරිච්ඡේදයේ 7.8 වගන්තිය | ගිවිසුම් කඩකර සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කර ඇති විදේශගත වූ ආචාර්යවරුන් සම්බන්ධයෙන් දන්වා යැවිය යුතු පාර්ශවයන් වෙත කිසිදු දැනුම් දීමක් කර නොතිබුණි. |
| (iii) 20වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 10 වෙනි පරිඡේදයේ 1.6.1 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් ගෙවන ලද රු.1,087,509,732 ක් වූ වැටුප් හා දීමනා තහවුරු කර ගැනීම සඳහා පැමිණීමේ හා පිටවීමේ සටහන් විගණනයට ඉදිරිපත් නොකෙරුණ අතර අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ ඔවුන්ගේ නිවාඩු සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් දී තිබුණද විගණිත දිනය දක්වා සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2003 සැප්තැම්බර් 09 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 830 | පාඨමාලා හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලය තුළින් ගාස්තු ලබා දීමට සුදුස්සෙකු වීමට, අදාළ සේවකයා තනතුරෙහි ස්ථිර කර තිබිය යුතු වුවත්, චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව පරිවාස කාලයේ සිටින ආචාර්යවරුන් 23දෙනෙකු සඳහා පාඨමාලා 26ක් වෙනුවෙන් රු.1,992,170ක පාඨමාලා ගාස්තු ගෙවා තිබුණි. |
| (ඇ) 2006 ජනවාරි 25 දිනැති අංක 8 දරන ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 (අ) වගන්තිය | සෑම අවස්ථාවකදීම ජාතික තරගකාරී ලංසු පිළිබඳ ප්‍රතිපත්තිය අනුගමනය කළ යුතු වුවත්, ඊට පටහැනිව විශ්වවිද්‍යාලයේ ආපනශාලා 2 ක් සමාලෝචිත වර්ෂයේ දී සේවකයන් අතරින් කුසපත් ඇදීමකින් පිරිනමා තිබුණි. |
| (ඇ) 2002 නොවැම්බර් 28 දිනැති හා අංක 141/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ පරිගණක උපාංග සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගත යුතු වුවත් එසේ කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 20,507,333 ක අතිරික්තයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.73,197,266 වූ බැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.93,704,599 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයීය පීඨ 4 හි අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයන් 10,455 දෙනෙකු වෙනුවෙන් රු1,813,208,326 ක පුනරාවර්තන වියදම් වැය කර තිබුණි. ඊට අනුරූපීව පසුගිය වර්ෂයේ ශිෂ්‍යයන් 9,619 දෙනෙකු වෙනුවෙන් රු.1,436,252,349 ක පුනරාවර්තන වියදම් වැයකර තිබුණි. ඒ අනුව සමස්ථ ඒක ශිෂ්‍ය පිරිවැය රු. 149,214 ක සිට රු. 173,429 ක් දක්වා රු.24,115 කින් එනම් සියයට 16 කින් වැඩිවී තිබුණි. එක් එක් පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය වෙන් වෙන් වශයෙන් පහත දැක්වේ.

| පීඨය | ඒක ශිෂ්‍ය පිරිවැය | |
|---|---|---|
| | 2013 | 2012 |
| | රු. | රු. |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 218,901 | 196,706 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 156,310 | 136,144 |
| කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය | 123,438 | 106,007 |
| වෛද්‍ය විද්‍යා පීඨය | 355,329 | 279,361 |

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුද්ගලික ආයතනයකින් ලබාගත් නේවාසිකාගාරය වෙනුවෙන් 2014 අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ කුලී මුදල් ගෙවා තිබියදී 2014 සැප්තැම්බර් හා ඔක්තෝම්බර් මාසවලට අදාළව කුලී මුදල් වෙනුවෙන් 2014 මාර්තු 13 වන දින රු.1,000,000ක අත්තිකාරම් ලබාදී තිබුණු අතර, 2014 ජුනි 13 දින ඉතිරි රු.640,920 ක මුදල ආයතනය වෙත ගෙවීම් කර තිබුණි. මෙසේ ඉදිරි කාලපරිච්ඡේදයක් වෙනුවෙන් ගෙවීම් කිරීමේ අවශ්‍යතාව විගණනයට පැහැදිලි නොකෙරුණි.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම අනුමත කර ඇති වැටුප් හා දීමනා වලට හා 1994 ජුනි 14 දිනැති අංක 95 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පරිබාහිරව විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන බාහිර ව්‍යාපෘති පාඨමාලා වලින් ලැබුණු ආදායමින් රු.3,152,491ක් දීමනා ලෙස අනධ්‍යයන කාර්ය මණ්ඩලය වෙත ලබාදී තිබුණි.

(ඇ) අධ්‍යයන නිවාඩු ලබා විදේශගතවූ ආචාර්යවරුන්ගෙන් ගිවිසුම් කඩකල 41 දෙනෙකුගේ බැඳුම්කර අගය රු. 85,304,889 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට මෙම මුදලින් රු. 71,633,636 ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි. දීර්ඝ කාලයක් ගතවී ඇති ඉහත බැඳුම්කර වෙනුවෙන් නිලධාරියාට හෝ ඇපකරුවාට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) 2011 අප්‍රේල් 20 දිනැති සහ අංක 1/2001 උසස් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3වන ඡේදය ප්‍රකාරව පෙර වර්ෂයේ පර්යේෂණ වාර්තාවල අන්තර්ගත කරුණු පිළිබඳව පර්යේෂණ කමිටුව සෑහීමකට පත්වේ නම් පමණක් ඊලඟ වර්ෂය සඳහා පර්යේෂණ දීමනා ගෙවිය යුතු වුවත්, 2012 වසරේ පර්යේෂණ වාර්තා පිළිබඳ අවධානය යොමු කිරීමකින් තොරව 2013 වර්ෂය තුළදී රු. 84,110,368 ක පර්යේෂණ දීමනා ගෙවා දී තිබුණි.

(ඉ) පිරිවැය රු.මිලියන 70 ක් වූ විශ්වවිද්‍යායේ අපජලය බැහැරකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2003 අගෝස්තු 06 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර, එම ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් ජල සැපයුම් හා ජලපවාහන මණ්ඩලය වෙත මූලික සැලසුම් සකස් කිරීම සඳහා රු. 2,336,090 ක් ගෙවා තිබුණි. පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුව විසින් කරුණු දැක්වූ පරිදි එම

ව්‍යාපෘතිය වෙනුවට ඉදිකිරීමට සැලසුම් කර තිබූ අපජලය එකතුකිරීමේ (Collection Network) ව්‍යාපෘතිය මෙතෙක් ආරම්භ කර නොතිබුණි.

(ඊ) විදුලි ඒකක 250 ඉක්මවා භාවිතා කරන සේවක ආපනශාලා 4 කින් 2013 වර්ෂය සඳහා අයකරගතයුතු රු.597,888 ක විදුලි ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා අයවිය යුතුව තිබූ රු.3,116,772 ක විදුලි ගාස්තු අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(උ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛයට අනුගතව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර ගැනීමට පෞද්ගලික සමාගමක් වෙත 2005 වර්ෂයේදී රු.1,147,412 ක් ගෙවා තිබුණද මූල්‍ය ප්‍රකාශන දිනය දක්වා ස්ථාවර වත්කම් ලේඛන පිළියෙළ කර නොතිබුණි.

(ඌ) ආයතනයකින් නේවාසිකාගාර කුළියට ගැනීමට අදාළව 2004 දෙසැම්බර් 23 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවන පරිදි ගෙවීම් කිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.12,868,737 ක් අදාළ ආයතනයට වැඩියෙන් ගෙවා තිබුණි. කුලී මුදල් වැඩිකිරීමට අදාළව කැබිනට් මණ්ඩල අනුමැතිය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) රජයේ හෝ රජය අනුබද්ධිත ආයතනවල සේවය සඳහා වැටුප් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත මුදා හරින ලද කථිකාචාර්යවරු දෙදෙනෙකු වෙනුවෙන් වර්ෂ කිහිපයක සිට ගෙවන ලද වැටුප් වලින් රු.1,690,141ක් තවදුරටත් ප්‍රතිපූරණය කරගත යුතු වුවද මෙම මුදල් ප්‍රතිපූරණය කළ නොහැකි බව අදාළ ආයතන දන්වා ඇත. ඒ අනුව එම වැටුප් අදාළ කථිකාචාරයවරුන්ගෙන් අය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සේවකයන් වෙත ලබා දී තිබූ රු. 2,201,370 ක් වූ වාහන, ආපදා හා සේවක ණය ශේෂයන් වර්ෂ ගණනාවක සිට අය නොවී පැවතුනි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණාධාර යටතේ පර්යේෂණ පැවැත්වීම සඳහා 2005 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ යෝජනා ඉදිරිපත් කළ ආචාර්යවරු 147 දෙනා අතරින් රු.14,305,845 ක් ලබාගත් ආචාර්යවරු 45 දෙනෙකු පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීම අවුරුදු එකේ සිට අවුරුදු අට දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සේවකයන් වෙත ලබාදී තිබූ රු. 2,201,370 ක් වූ වාහන, ආපදා හා සේවක ණය ශේෂයන් වර්ෂ ගණනාවක සිට අය නොවී පැවතුනි.

[

(ඇ) රු. මිලියන 61.5 ක් වැයකර 2001 වර්ෂයේදී මිලදීගත් කොහුවල ඉඩම හා ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයකට නොගැලපෙන හෙයින්, කැළණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය වෙත 2003 ඔක්තෝම්බර් 17 දින පවරා දී තිබුනු අතර, මෙම ගොඩනැගිල්ල ස්ථිරවම සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය වෙත පවරා දීම වෙනුවෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත රු.මිලියන 150 ක් ලබාදීමට එකඟව තිබුණි. එම මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) වෛද්‍ය පීඨය සඳහා මෙත්සෙවන ඉඩමෙන් අක්කර 05 ක බිම් ප්‍රමාණයක් සඳහා 1998 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක් ගෙවා තිබුණි. එහෙත්, මෙතෙක් පවරාගෙන තිබුණේ ඉන් අක්කර 1 පර්චස් 34.2 ක් පමණි. ඉතිරි බිම් කොටස් මෙතෙක් පවරාගෙන නොතිබුණි. ගෙවා තිබූ රු.මිලියන 24 නොපියවූ අත්තිකාරම් ලෙස වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.

## 4.4 අරමුදල් ඌන උපයෝජනය

-----------------------------

එකතුව රු.25,371,411 ක් ත්‍යාග අරමුදල් (Endowment Funds) 69 කින් පවරාගත් රු.18,537,995 අයෝජනය කර තිබුණි. මේ අනුව අරමුදල්වල පවතින රු. 6,833,416 ක මුදල ආයෝජනය කර නොතිබුණි.

## 4.5 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

--------------------------------------

සිසුන් 300 කට නේවාසිකාගාර පහසුකම් සපයා දීමේ අරමුණින් 1998 මැයි 05 වන දින බස්නාහිර පළාත් සභාවට රු.මිලියන 1.6 ක් ගෙවා බොරලැස්ගමුවේ පිහිටි පර්චස් 41.31 ක ඉඩම , කැස්බෑව ප්‍රාදේශීය ලේකම්තුමා විශ්වවිද්‍යාලය වෙත 2003 අගෝස්තු 06 වන දින භුක්තිය පවරා තිබුණි. එදින සිට මෙම සමාලෝචන වර්ෂය අවසානය දක්වාම ඉඩම ඵලදායි කාර්යයක් සඳහා යොදාගෙන නොතිබූ අතර, කිසිදු සංවර්ධන කටයුත්තක් සිදුකර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති සහ පාලන අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) පාලන ගිණුම්

(ඇ) සුළු මුදල් පාලනය

(ඈ) ස්වයං මූල්‍ය පාඨමාලා කළමනාකරණය

(ඉ) ගබඩා පාලන

(ඊ) ගිවිසුම් හා බැඳුම්කර